## “ආපදා කළමණාකරණය” පිළිබඳ දැනුවත් කිරීමේ අභ්‍යාසයක්

ආපදා කළමණාකරණය *(Disaster Management)* යන තේමාව යටතේ සංවිධානය කළ දෙවන “ටේබල් ටොප්” අභ්‍යාසය පසුගිය බ්‍රහස්පතින්දා දින (ජන 05) *(Exercise Tabletop)* කන්කසන්තුරය උතුරු නාවික විධානයේ *(SLNS - Uththara, Kankesanturai)* පැවැත්වුන බව ශ්‍රී ලංකා නාවික හමුදා නිල වෙබ් අඩවිය පවසයි.

මූලිකව ආපදා කළමණාකරණය/හදිසි තත්වයන් පිළිබඳව නිලධාරීන් දැනුවත් කිරීම මෙම අභ්‍යාසයේ මූලික අරමුණ වූ අතර එයට අමතරව හදිසි තත්වයන් යටතේ ක්‍රියාකිරීම/හදිසි ආපදා තත්ත්වයකට මුහුණදීමේදී නිලධාරීන් වෘතිය මට්ටමින් ක්‍රියාකිරීම, වෘත්තීමය වශයෙන් ඒ සඳහා සූදානම්වීම මෙන්ම තරුණ නිලධාරීන්ට අවශ්‍යය ශක්තිය සහ වෘත්තීමය හැකියාව ලබාදීමත් යන කරුණුද මෙම අභ්‍යාසයේ දී වඩාත් සැලකිල්ලට ගන්නාලදී. ඒ පිළිබඳව සංවිධානය කරන ලද අභ්‍යාස කිහිපයක් ද මෙහිදී පවත්වනලදී.

දවසපුරා ක්‍රියාත්මක වූ මෙම අභ්‍යාසය සඳහා උතුරු විධානයට අයත් නාවික කඳවුරු වල නිලධාරීන් මෙන්ම ශ්‍රී ලංකා වෙරළාරක්ෂක බලකායේ උතුරු කලාප නිලධාරීන්ද ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ද රැසක් සහභාගි වූ බව එම පුවත වැඩි දුරටත් සඳහන්කරයි.